# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 22 දරන
# කොළඹ මහා මුස්ලිම් පල්ලිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 අගෝස්තු මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 22 දරන කොළඹ මහා මුස්ලිම් පල්ලිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1986 අගෝස්තු මස 21 වන දින]

**එල්. ඩී.—ඕ 30/84.**

**කොළඹ මහා මුස්ලිම් පල්ලිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"කොළඹ මහා මුස්ලිම් පල්ලිය" නමින් පොදුවේ හැඳින්වෙන ඉස්ලාමීය පූජනීය ස්ථානයක් වර්ෂ හාරසිය පණහකට අධික කාලයක සිට කොළඹ නගරයෙහි පිහිටුවා ඇති හෙයින් ද: පූර්විකාව.

කොළඹ මහා මුස්ලිම් පල්ලි පරිෂදය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, කොළඹ මහා මුස්ලිම් පල්ලියට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා කොළඹ පිහිටුවා ඇති හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් ඒ සංගමය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 22 දරන කොළඹ මහා මුස්ලිම් පල්ලිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට, (මෙහි මින් මතු "මුස්ලිම් පල්ලිය" යනුවෙන් හඳුන්වනු ලබන) කොළඹ මහා මුස්ලිම් පල්ලියේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන්, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කොළඹ මහා මුස්ලිම් පල්ලිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තවද, එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි අතර එකී නාමයෙන් පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, භාවිච්චි කිරීමට ද, සිය කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. කොළඹ මහා මුස්ලිම් පල්ලිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ඉස්ලාමීය පූජනීය ස්ථානයක්, සංස්කෘතික මධ්‍යස්ථානයක් හා සමාජයක් වශයෙන් මෙම පල්ලිය ගොඩනැගීම, පුනස්ථාපනය කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම;

(ආ) පල්ලියට අනුබද්ධ සිද්ධස්ථාන සහ සුසාන භූමි පුනස්ථාපනය කිරීම, නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම;

(ඈ) අධ්‍යාපනයේ ප්‍රගතිය සඳහා මෙයින් සළසා ඇති පහසුකම් හා අවශ්‍ය සියලු දේ සැළසීම;

(ඇ) අසරණයන්, අනාථයන්, දිළිඳු තැනැත්තන් හා රෝගීන් සඳහා කෑම බීම, පෝෂණ ශක්තිය, වෛද්‍ය ආධාර, ඇඳුම් හා නිවාස ආදිය ලබා දීමෙන්, කුසගින්න, රෝගාබාධ හා ලෙඩ දුක් සම්බන්ධයෙන් සහනය සැලසීම;

(ඉ) ස්වේච්ඡා මහජන පුණ්‍යාධාර සහාය සහ සදකා නමැති දුගී දීමනාව එකතු කිරීම සහ බෙදාදීම; සහ

(ඊ) ඉහත සාමාන්‍යයෙන් සඳහන් පරමාර්ථ හෝ ඉන් යම් කිසිවක් මුදුන් පමුණුවා ගැනීමට ආනුෂංගික වන හෝ හිතකර වන සියළු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

4. (1) සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව, තෝරා පත් කර ගනු ලබන භාරකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයේ ධුර දරන භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

දේපළ භාරකාරත්වය.

5. සංස්ථාවට අයත් සියලු චංචල හා නිශ්චල දේපළවල භාරකාරත්වය සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, භාරකාර මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතුය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් කලින් කල සංස්ථාවේ යම් වාර්ෂික මහ සභා රැස්වීමක දී හෝ තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන යම් රැස්වීමක දී හෝ ඊට පැමිණ සිට ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කරුණු සියල්ල හෝ කිසිවක් සඳහා මෙම පනතට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම හෝ නෙරපීම;

(ආ) සංස්ථාවේ භාරකාර මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්ය හා කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ රැස්වීම්වල දී සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඈ) සංස්ථාවේ පරිපාලනය හා කළමනාකරණය;

(ඉ) සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික මුදල් හා එම සාමාජික මුදල් එකතු කර ගැනීම පිළිබඳව නිගමනය කිරීම; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) එවැනි රීති සාදනු ලැබූ විට, එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් ඒ රීති වෙනස් කිරීම, ආකලනය කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි වන අතර එසේ කළ යුත්තේ (3) වන උපවගන්තියේ නියමයන්ට අනුකූලව ය.

(3) සංස්ථාවේ යම් රීතියක් වෙනස් කිරීම, ආකලනය කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම පිළිබඳව පූර්ව නිවේදනයක් අඩුම වශයෙන් දින පහළොවක් කල්තබා සාමාජිකයින්ට නොදී වෙනස් කිරීම, ආකලනය කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකළ යුතු ය.

මුස්ලිම් පල්ලියෙන් ගෙවිය යුතු සහ මුස්ලිම් පල්ලියට අයවිය යුතු ණය.

7. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පල්ලියේ පවත්නා සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, පල්ලියට අයවිය යුතු සියලු ණය හා ගෙවනු ලැබිය යුතු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සභාපති හා භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිටදී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයට තම නම් අත්සන් කළ යුතුය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි හා බැහැර කළ හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු බුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හෝ දැරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව තිබිය යුතු අතර, එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්වන රීතිවලට යටත්ව, එකී සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නාවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම් වලට, මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි, කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය,